# තනතුරු ඇබෑර්තු

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

සමාජ සේවා දෙපාර්තමේන්තුව

සංඥා භාෂා පරිවර්තක/ පෙර පාසල් ගුරු/ අරක්කැමි සහායක/ උපස්ථායක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ

සංඥා භාෂා පරිවර්තක තනතුරු 16ක්,
පෙර පාසල් ගුරු තනතුරු 07ක්,
අරක්කැමි සහායක තනතුරු 04ක් හා
උපස්ථායක තනතුරු 05ක්

සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට 2025.11.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සංඥා භාෂා පරිවර්තක/පෙර පාසල් ගුරු/ අරක්කැමි සහායක/ උපස්ථායක - (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්:-

**1. සංඥා භාෂා පරිවර්තක - තනතුරු 16**

ප්‍රධාන කාර්යාලය -බිහිරි පරිවර්තක 01/දමිළ පරිවර්තක - 01
තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය - 01
අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය - 01
සීදුව වෘත්තීය පුහුණු ආයතනය - 01
කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය - 01
මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය - 01
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
පොළොන්නරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 01

*1.1 විවෘත බඳවා ගැනීම :*

1.1.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

1.1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම;

සහ

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.1.3. වෘත්තීය සුදුසුකම් :-

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

හෝ

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

හෝ

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය

1.1.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

1.1.5 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.1.6. වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම,
iii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.1.7. බඳවාගැනීමේ ක්‍රමය :- ලිඛිත හා වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

1.1.7.1 ලිඛිත පරීක්ෂණය :-

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව | කාලය පැය 01 | 100 | 40 |

1.1.7.2 වෘත්තීය පරීක්ෂණය :- සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම | කාලය පැය 01 | 100 | 40 |

1.1.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබාදෙනු නොලැබේ.)

1.1.9. වැටුප් පරිමාණය :- රා.ප.ච. 10/2025 අනුව MN 02 -2025

වැටුප් පරිමාණය රු.48,470-10x540-11x630-10x1,010-10x1,190-රු. 82,800/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

1.1.10 සටහන-

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.1.11. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*1.2 සීමිත බඳවා ගැනීම :-*

1.2.1 අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්වී තිබීම.

1.2.2 වෘත්තීය සුදුසුකම් -

ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන එක් අවුරුදු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු සංඥා භාෂා පරිවර්තන ඩිප්ලෝමා සහතිකය.

1.2.3 පළපුරුද්ද -

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක හෝ නිවාස පාලක තනතුරක වසර 05කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.2.4 කායික සුදුසුකම්-

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.2.5 වෙනත්-

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහක (05) කාලසීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

1.2.6 වයස - අදාළ නොවේ

1.2.7 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

1.2.7.1. ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව | කාලය පැය 01 | 100 | 40 |

1.2.7.2. වෘත්තීය පරික්ෂණය-

| විෂයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සංඥා භාෂා ප්‍රායෝගික දැනුම පරික්ෂා කිරීම | කාලය පැය 01 | 100 | 40 |

1.2.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-

තනතුරට නියමිත සුදුසුකම් තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබා දෙනු නොලැබේ).

1.2.9. සටහන

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේ දීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

1.2.10. සේවා කොන්දේසි

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

**2. පෙර පාසල් ගුරු (තනතුරු 07)**

සිතිජය ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 03

කොට්ටාව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 03

නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - 01

2.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව. ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

2.3. වෘත්තීය සුදුසුකම් :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

2.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

2.5 බඳවාගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකෙන්ම සමත්, උපරිම ලකුණු සංඛ්‍යාවක් ලබාගන්නා සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනේ.

2.5.1 ලිඛිත පරීක්ෂණය :-

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| භාෂා හැකියාව | කාලය පැය 01 | 100 | 40 |

2.6. වැටුප් පරිමාණය :- රා.ප.ච. 10/2025 අනුව MN 01 -2025

වැටුප් පරිමාණය

රු.45,230/- 10X540-11X630-10X890-10X1,190-රු.78,360/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

2.7. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*2.8 සටහන :-*

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යෙන් ම සේවය කළ යුතුය.

3. අරක්කැමි සහායක (තනතුරු 04) / උපස්ථායක (තනතුරු 05)

අරක්කැමි සහායක - 04

වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය - 01

බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය - 01

කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය - 01

මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය -01

උපස්ථායක - 05

රිදියගම කලන නිවර්තන නිවාසය (උපස්ථායක) -02

සීදුව වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) -01

මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) - 01

කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය (උපස්ථායිකා) -01

*3.1 වයස් සීමාව :-*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

*3.2 අධ්‍යාපන සුදුසුකම් :-*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

*3.3. වෘත්තීය සුදුසුකම් :-*

අරක්කැමි සහායක

රජයේ ලියාපදිංචි ආයතනයක සූප ශාස්ත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

උපස්ථායක

රජයේ රෝහලක, බෙහෙත් ශාලාවක හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි පෞද්ගලික රෝහලක උපස්ථාන කටයුතු සම්බන්ධ පුහුණුවක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය).

*3.4. පළපුරුද්ද :-*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

*3.5. බඳවා ගැනීමේ ක්‍රමය :-*

මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනීම සිදු කෙරේ.

*3.6. වැටුප් පරිමාණය :-* රා.ප.ච. 10/2025 අනුව PL 1 -2025 වැටුප් පරිමාණය

රු.40,000-10x450-10x490-10x540-12x590-රු. 61,880/- වේ.

(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

*3.7. සේවා කොන්දේසි* :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

*3.8 සටහන*

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

දර්ශනී කරුණාරත්න,
සමාජ සේවා අධ්‍යක්ෂ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 මහළ,
II අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

2025 ඔක්තෝබර් මස 07 වැනි දින.